# ඉන්දියාව සහ අපි




මේ දිනවල කවුරුත් කතා කරන්නේ, ශ්‍රී ලංකාවේ ජනවාර්ගික, අවුල ගැන ඉන්දියාවේත්, විශේෂයෙන් තමිල්නාඩුවේත්, බලපෑම් කොතරම් දුරට සිදුවේද යන්න ගැනය. ඉන්දියාවේ සමකාලීන දේශපාලන ඉතිහාසයත්, එම ඉතිහාසය තුල තමිල්නාඩුවේ භූමිකාවත්, නිරීක්ෂණයට ගැනීම දුෂ්කරය. ඉන්දියාව යටත් විජිතයක්ව තිබූ යුගයේදී, එම විශාල දේශය, ප්‍රාන්ත 11කින් සමන්විත වූ අතර ලොකු කුඩා මහ රාජා වරුන්ගේ ප්‍රදේශ, වෙනම පාලනය කිරීමට බ්‍රිතාන්‍ය පාලකයෝ ක්‍රියා කලහ. මේ ප්‍රාන්ත 11න්, 6ක් විශාල ප්‍රාන්ත විය. මේ විශාල ප්‍රාන්ත වලිනුත් ජනගහනයෙන් හා භූමිප්‍රමාණයෙන් ප්‍රමුඛ තැන ගත්තේ (Madras Prsidancy හෙවත්, මදුරාසි ප්‍රාන්තයයි. මේ ප්‍රාන්තය, නැගෙනහිර වෙරළේ, ඔරිස්සා ප්‍රාන්තයේ සීමාවේ සිට බටහිර වෙරළේ, බැංග්ලෝ වරාය දක්වා දික්වීය. දෙවන විශාල ප්‍රාන්තය වූයේ උත්තර ප්‍රදේශය හෙවත් එවකට "එක්සත් ප්‍රදේශය" යනුවෙන් හැඳින්වුන පලාතයි. ජන අනුපාතය අනුව ඊළඟට සමතැන් ගත්තේ බෙංගාල, පන්ජාබ හා "බොම්බෙ ප්‍රසිඩන්සි" නමින් හැඳින්වුන බටහිර ප්‍රාන්තයයි. මේ හැර මධ්‍යම ප්‍රාන්තය, බිහාරය ඔරිස්සාව, ඇස මය, සින්ද ප්‍රාන්තය හා වයඹ දිග සීමා ප්‍රාන්තයද මීට අයත් විය.

1947 දී නිදහස ලැබීමෙන් පසු සින්ද් ප්‍රාන්තය හා වයඹදිග දේශ සීමා ප්‍රාන්තයත්, බෙදීගිය පකිස්තානයට අයත් විය. මේ හැර පන්ජාබය හා බෙංගාලය නැමැති විශාල ප්‍රාන්ත දෙකද, ඉන්දියාව හා පකිස්තානය අතර දෙකට බෙදී ගියේය.

නිදහස් ඉන්දියාව ඉහත කී ප්‍රාන්ත කලක් ඒ තිබූ අන්දමින්ම විමධ්‍යගත කර තිබුණි. එහෙත් 1953 දී මදුරාසි ප්‍රාන්තය ගැටුමකට අරටුව විය.

මදුරාසි ප්‍රාන්තයේ වැඩිම ජනගහනය සිටියේ වර්තමාන ටැමිල්නාඩුවේය. එහෙත් ඊට යාබද ආන්ද්‍රා සහ කේරල ප්‍රාන්ත වලින් කොටස්ද, වර්තමාණ කර්ණාටක ප්‍රාන්තයට අයත් බටහිර මුහුදුබඩ කුඩා ප්‍රදේශයද මදුරාසි ප්‍රාන්තයට අයිති වී තිබුණි. විනධ්‍යා කඳුකරයෙන් පහත ද්‍රවිඩ දේශයේ මයිසූරය, මලබාරය හා ට්‍රැවන්කෝර් යන මහරාජා යන ප්‍රාන්ත පාලනය කරන ලද්දේ මහරාජා වරුන් විසිනි. මහරාජා වරුන්ට තිබූ බලතල සීමිත විය.

ආන්ද්‍රා ප්‍රදේශ නමින් හැඳින්වෙන තෙලිඟු භාෂාව කතා කරන, ජන ගහනයෙන් අඩක් හිමිව තිබුණේ, හයිඩ්‍රබාද් නිසාම් (මහරාජා) පාලනයටය. වර්තමාන මහ රජුට ප්‍රාන්තයේ කොටසක්ද ඔහුගේ පාලනයට නතුවිය.

මුල්ම වෙඩිල්ල පත්තු වූයේ තෙලිඟු ජනතාවගෙනි. ටමිල් නාඩුවේ දෙමළ පාලකයෝ තෙලිඟු ජනතාවට කුඩම්මාගේ සැලකිලි දක්වන බව කියමින්, ඔවුහු තම ප්‍රදේශය මදුරාසි ප්‍රාන්තයෙන් වෙන් කරන ලෙස ඉල්ලා "දෙමළ විරෝධී" උද්ඝෝෂනයක් ඇරඹූහ. උද්ඝෝෂනයේ නායකයන් වූයේ භාරත නිදහස් සටනේදී " ආන්ද්‍රාවේ සිංහයා" යන විරුදාවලිය ලත් ටී. ප්‍රකාසම් හා ජ්‍යේෂ්ඨ කොන්ගස් නායකයෙක් වූ "ඔට්ටු ශ්‍රී රාමුෂන්"ය.

කෙසේවුවද අග්‍රාමාත්‍ය ජවහල්ලාල් නේරු මේ ප්‍රාන්ත බෙදීමෙන් අනවශ්‍ය බේද ඇතිවන්නේය යන ප්‍රතිපත්තිය උඩ මේ ඉල්ලීම ප්‍රතික්ෂේප කලේය.

නේරුගේ නායකත්වයට ගරු කලද ප්‍රතිපත්තියට, විරුද්ධ වන බව කියමින්, ඔට්ටු ශ්‍රී රාමුළු, මාරාන්තික උපවාසයක් ඇරඹුවේය. මහත් ආන්දෝලනයක් ඇති වූ අතර - තත්වය භයානක අතට හැරුනේ, ශ්‍රී රාමළු නිරාහාරයෙන් මියගිය පසුය. තෙළිඟු ප්‍රදේශයේ බෙස්වාඩා (වර්තමාන විජය වාඩා) ගුන්දෙර් හා නල්ලෝර් වැනි විශාල නගර වල හා විසාක පට්නම් වරායේද කැරලි ගැසූ වැසියෝ දෙමල ජාතිකයින්ට අයිති කඩ සාප්පු වලට ගිනි තැබූහ. අවසානයේදී ජවහල්ලාල් නේරු තම දැඩි ස්ථාවරය අතහැර, තෙළිඟු දේශම් නමින් නව ප්‍රාන්තයක් වෙන් කිරීමට එකඟ විය. එහි නම වූයේ ආන්ද්‍රා ප්‍රදේශයයි. එහි මහ ඇමති පදවිය හිමි වූයේ ටී. ප්‍රකාශම්ටය.

ඉන්දියාවේ ප්‍රාන්ත බෙදීම ඇරඹුනේ එදාය.

පසුකාලයකදී, මහරාජා වරුන්ගේ සීමිත පාලනය අවසන් වීමත් සමග, ප්‍රාන්ත යලි බෙදී ගියෝය. ට්‍රැවන්කෝර් සහ මලබාර යන කොටස්, කොචීන් රාජ්‍යයට එක්කොට කේරල ප්‍රාන්තය බිහිවිය. එහි භාෂාව මලයාලම් වීය. හයිඩ්‍රබාද් රාජ්‍යයෙන් විශාල කොටසක් ආන්ද්‍රා ප්‍රදේශයට එක්වීම නිසා එය විශාලතම ද්‍රවිඩ ප්‍රාන්තය බවට පත්විය. එහි භාෂාව තෙලිඟු විය. මයිසූරය වෙනම ප්‍රාන්තයක් වූ අතර එහි භාෂාව කන්න විය. කේරලයේ භාෂාව මලයාලම් විය.

ප්‍රාන්ත එසේ බෙදී ගියද 1960 දශකය වනතුරු සෑම ප්‍රාන්තයකම බලය හිමිවූයේ මධ්‍යම රජයේද බලය පවත්වාගෙන ගිය කොන්ග්‍රස් (ඉන්දියානු ජාතික සංගමය) පක්ෂයටය. මුලින්ම එම පක්ෂයේ බලය ගිලිහී ගියේ කේරළ ප්‍රාන්තයේ කොමියුනිස්ට් ප්‍රාන්ත රජයක් බිහිවීමෙනි.

*මුල්ම වෙඩිල්ල පත්තු වූයේ තෙලිඟු ජනතාවගෙනි. ටමිල් නාඩුවේ දෙමළ පාලකයෝ තෙලිඟු ජනතාවට කුඩම්මාගේ සැලකිලි දක්වන බව කියමින්, ඔවුහු තම ප්‍රදේශය මදුරාසි ප්‍රාන්තයෙන් වෙන් කරන ලෙස ඉල්ලා "දෙමළ විරෝධී" උද්ඝෝෂනයක් ඇරඹූහ. උද්ඝෝෂනයේ නායකයන් වූයේ භාරත නිදහස් සටනේදී "ආන්ද්‍රාවේ සිංහයා" යන විරුදාවලිය ලත් ටී. ප්‍රකාසම් හා ජ්‍යේෂ්ඨ කොන්ගස් නායකයෙක් වූ "ඔට්ටු ශ්‍රී රාමුෂන්"ය.*

මීලඟට සිදුවූයේ කුමක්ද?

හින්දි භාෂාව ඉන්දියාවේ රාජ්‍ය භාෂාව කිරීමට කිසිම ප්‍රාන්තයකින් විරෝධයක් පැන නැගුනේ නැත. එහෙත් තමිල්නාඩු ප්‍රාන්තය ද්‍රවිඩ මුත්තේත්‍ර කසගම් (DMK) පක්ෂය උද්ගෙ ෝෂණයක් ගෙන ගියද එය සාර්ථක නොවීය.

1946දී, ශ්‍රී ලංකා අගමැති සිරිමා බන්ඩාරනායක මැතිනිය හා ඉන්දියා අගමැති භහදූර් ශ්‍රාසත්‍රී මහතාද නවදිල්ලියේදී ඓතිහාසික ගිවිසුමක් අත්සන් කලහ. ඒ ගිවිසුම අනුව ශ්‍රී ලංකාවේ වාසය කරන ඉන්දියානු සම්බවය ඇති ජනතාවගෙන් පන්ලක්ෂ විසිපන්දාහකට, ඉන්දියානු පුරවැසිකම ලබාදීමටත්, තුන් ලක්ෂයකට ලංකා පුරවැසිකම ලබාදීමටත් එකඟවන ලදී.

ටැමිල් නාඩුවේ එවකට මහ ඇමති පදවිය දැරූ, කොන්ග්‍රස් පක්ෂයේ 'භක්ත වත්සලම්' මහතා මේ ගිවිසුම ඉතා අගනා මානුෂික ගිවිසුමක් බව ප්‍රකාශ කරමින් ඊට සම්පූර්ණ සහයෝගය දැක්වීය. එහෙත් සී. අන්නදොරේ නායකත්වය දැරූ 'ද්‍රවිඩ මුන්නේත කසගම්' පක්ෂය මෙය ලංකාවේ දෙමළ ජනතාවගේ ආත්මගෞරවය පාවාදීමක්යැයි කියමින් ඊට විරෝධය පලකලේය.

1967 ඉන්දියානු ප්‍රාන්ත මැතිවරණය නිදහස් ඉන්දියානු ඉතිහාසයේ ඓතිහාසික සංධිස්ථ ානයක් විය. ටැමිල්නාඩු ප්‍රාන්තයේ බලය සඳහා ඉදිරිපත් වූ DMK පක්ෂයේ ප්‍රධාන සටන් පාඨ දෙක වූයේ හිංදි භාෂාව රාජ්‍ය භාෂාව කිරීමට විරෝධය හා සිරිමා ශ්‍රස්ත්‍රී ගිවිසුමට විරෝධය පෑමත්ය. ප්‍රතිඵලය වූයේ DMK පක්ෂ, තමිල්නාඩු ප්‍රාන්තය ජය ගැනීමයි. කෙසේ වුවද C.N. අන්නදොරේ ගේ මරණෙන් පසු DMK පක්ෂය දෙකඩ වී ගියේය. එදා පටන් අද වනතුරුත් මේ ප්‍රාන්තයේ බලය තට්ටු මාරුවෙන් හිමිවුවේ කරුනානිධිගේ නායකත්වයෙන් යුත්, පක්ෂය වූ DMK පක්ෂයට හා එයින් කැඩී බිඳී ගිය M.I. රාමචන්ද්‍රන්ගේ පක්ෂය වූ ඕල්ඉන්ඩියා අන්ඩඩි එම් කේ පක්ෂයටත්ය.

මහරජගේ බලයට පත්, ප්‍රධාන පක්ෂ සෑම මැතිවරණයකදීම මේ පක්ෂ දෙකෙන් එකක් සමග, නිතර ගිවිසුම් ඇති කර ගත්හ.

1983 ශ්‍රී ලංකාවේ සිදුවූ අමානුෂික බේදවාචකයෙන් පසු තමිල් නාඩුවෙන් පැන නැගුණු විරෝධය මුළු ඉන්දියාව පුරාම පැතිර ගියේය. එදා පටන් ගතවූ 25ස් වසර තුල ඉංදුලංකා සබඳකම් වරින් වර හොඳ නරක දෙකටම හැරුණ අන්දම දීර්ඝ වශයෙන් විස්තර කිරීම අනවශ්‍යයයි.

තමිල්නාඩුව තුල කොටි සංවිධානයට තිබූ පක්ෂපාතීත්වය දෙදරා ගියේ රජීව ගාන්ධි ඝාතනය කිරීමේ අමානුෂික සිද්ධියෙන් පසුවය.

එම ඝාතනය "තකතීරු මෝඩ ක්‍රියාවක්" බව ඇන්ටන් බාලසිංහම් ප්‍රකාශ කලේ ඔහුගේ මරණයට මාස කීපයකට පෙරය. මේ ඝාතනය නිසා තමිල්නාඩුවේද ප්‍රභාකරන් හා කොටි සංවිධානයට විරුද්ධව ජනමතයක් ක්‍රියාත්මක වී ඇත.

කොටි සංවිධානය විශාල පසුබැස්මකට ගොදුරු වී ඇති මේ අවස්ථාවේදි ටමිල් නාඩුවේ සටන් විරාමයක් සඳහා උද්ගොෂණ පැන නැගීම, ස්වභාවිකය. එහෙත් අසූව දශකයට සාපේක්ෂව අද පැන නැගී ඇති තත්වය ශ්‍රී ලංකාවට එතරම් අහිතකර නොවන බව පහත සඳහන් සාදක වලින් ඔප්පු වේ.

1. තමිල් නාඩුවේ මහ ඇමති රහසේ කොටි සංවිධානයට උදව් දෙන බවට විපක්ෂ නායිකා ජය ලලිතා චෝදනා නැගීම.

2. මහ ඇමති කරුණා නිධි, ත්‍රස්තවාදය නම් පරාජය කල යුතු බව තමා පිලිගන්නේ යයි ප්‍රකාශ කිරීම.

3. බෙදුම් වාදි ප්‍රකාශයක් නිසා, ප්‍රභාකරන්ට ඉතාමත් හිත්වත් ටමිල්නාඩු පාර්ලිමේන්තු මන්ත්‍රී වයි කෝපාල් සාමි (වයිකු) දේශද්‍රෝහි චෝදනා උඩ අත්අඩංගුවට ගැනීම.

4. බැසිල් රාජපක්ෂ මහතාගෙන් යුත් දූත පිරස හා ඉන්දියානු විදේශ ඇමති ප්‍රනාද් මුකර්ජි අතර කල සාකච්ඡා වලින් පසු, නිකුත් කරන ලද ඒකාබද්ධ නිවේදනයෙන් ත්‍රස්තවාදයට විරුද්ධව සටන් කිරීමට ඕනෑම රටක රජයට ඇති අයිතිය පිළිගැනීම.



*ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්*

එස්. පියසේන

KJL
ශ්‍රී ලාංකික ඔබේ සියලු අවශ්‍යතා සඳහා
SPICE CORNER
Monday - Thursday 10.30am to 8.00pm
Friday - 10.30am to 9.00pm
Saturday - 10.30am to 9.00pm
Sunday - 10.30am to 8.00pm
ශීත කළ ආහාර
රසකැවිලි
හාල්
තුන පහ වර්ග
විඩියෝ ඩීවිඩී සීඩී
හින්දි සිංහල චිත්‍රපට
ඉන්දියානු ශ්‍රී ලංකා සාරි සහ බ්ලවුස්
මැණික් හා ස්වර්ණාභරණ
ෆෝන් කාඩ්ස්
වෙසක් සුබපැතුම් පත්
දිනපතා උණු උණු ආහාර
බුරියානි
බත්
පෑන් රෝල්ස්
වඩේ
weekly video hire 75c
විඩියෝ ඔබටම අයිති කරගන්න ඩොලර් 1
16 Bellerive Avenue Mount Waverley
Tel : 9544 7189 Mob 0418 351 620 Fax : 9562 5503